ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

VII සභා වාරය පනස් නමවන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.
දිනය : 2023.01.10.
වේලාව : පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
18.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
21.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.

නිලධාරි සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් නමවන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් සහ මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.12.13. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් 2022.12.13. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

"ලිපි පෙත්සම් (03) (ii)"
යන සඳහන දෙවරක් සඳහන් වී ඇති බැවින් එක් අංකයක්,
"ලිපි පෙත්සම් (03) (iii)" ලෙසටත්,

"යථා පරිදි කල් දි ඇති යෝජනා තීරණ අංක (05) (vii)"
යන සඳහන දෙවරක් සඳහන් වී ඇති බැවින් එක් අංකයක්,
"යථා පරිදි කල් දි ඇති යෝජනා තීරණ අංක (05) (viii)" ලෙසටත් සංශෝධනය විය යුතු බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2022.12.13. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සේවයේ යෙදී සිට විශ්‍රාම ලැබූ නිලධාරින් හා ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ සේවය ඇගයීම සඳහා සභා කාර්යාලයේ ලේකම් ප්‍රමුඛ කාර්ය මණ්ඩලය විසින් සමුගැනීමක් සංවිධානය කර ඇති බැවින් ඒ සඳහා සහභාගී වන ලෙසට ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ආරාධනා කරනවා.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි රාජ්‍ය ආයතන අතර සුහඳතාවය වර්ධනය කිරීමේ අරමුණින් ඉඹුල්පේ යෞවන ප්‍රාදේශීය සම්මේලනය විසින් ඉඹුල්පේ ර/ ශාරිපුත්‍ර මහා විද්‍යාල ක්‍රීඩාංගනයේ දී 2023/01/14 වෙනි දින තුල ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවට ඉඹුල්පේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, සහකාර තරුණ සේවා නිලධාරි, ජී.එච්. රුවන් අනුර කුමාර මහතා දැනුම් දී තිබෙන බැවින් ඒ සඳහා සහභාගී වන ලෙසට ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ආරාධනා කරනවා.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පඹහින්න ජල ව්‍යාපෘතිය මගින් පණුගල්ගොඩ මාර්ගයේ මීටර් 480 ක් දුරට ජල නල එළලීමට යෝජනා වී තිබූ බැවින්, යෝජිත පරිදි එම කටයුතු ආරම්භ කරන ලද අවස්ථාවේ දී එම මාර්ගයේ ගම්වාසීන්ට පානීය ජලය අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරමින්, ජල නල එළලීමේ කටයුතු වලට විරෝධතා දක්වීමත් සමඟ එම ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම පරිදි, එම මාර්ගයේ ජල නල එළලීමේ කටයුතු අත්හිටවූ බවට ජල සම්පාදන අමාත්‍යාංශ, ජල සම්පාදන අමාත්‍යාංශ හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ, රත්නපුර දිස්ත්‍රික් කළමණාකරු විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
ජල උල්පත් මඟින් ජල සම්බන්ධතා ලබාගැනීම හේතුවෙන් මෙම මාර්ගයේ ඉහළ කොටසේ පදිංචිකරුවන්ට පානීය ජලය අවශ්‍ය නොවන බවත්, උල්පත් මඟින් ජල සම්බන්ධතා ලබා නොගත් එම මාර්ගයේ ම වෙල්යාය දක්වා පදිංචිකරුවන්ට ජල සම්බන්ධතා අවශ්‍ය බවට ඉල්ලුම් කරන බැවින්, එම කොටසට ජලනල එළලීමේ කටයුතු සිදු කරන ලෙසට අදාල ආයතනය දැනුවත් කරමු.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග පලුදු කිරීමේ කටයුතු සඳහා අවසර ලබා දීමේ බලය ප්‍රාදේශීය සභාව සතු වේ. ජල සම්බන්ධතා ලබා දීම සඳහා පණුගල්ගොඩ මාර්ගයේ ජල නල එළලීමේ කටයුතු වලදී ජල සම්බන්ධතා අවශ්‍ය නොවන බව සඳහන් කරමින්, බාධා කරන ලද ප්‍රදේශවාසීන් පිළිබඳව ලිඛිතව තොරතුරු ලබා ගැනීමටත්, එම මාර්ගයේම ජල අවශ්‍යතා ඇති ගම්වාසීන්ට ජල සම්බන්ධතා ලබා දිය යුතු බැවින්, ජල ව්‍යාපෘතියේ වැඩනිමා කිරීමට පෙර එම මාර්ගයේ ජල නල එළලීමේ කටයුතු විධිමත් පරිදි සිදු කරන ලෙසට, ජල සම්පාදන අමාත්‍යාංශයේ, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ දිස්ත්‍රික් කළමණාකරු වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අලුත්නුවර ගල්පීල්ල ප්‍රදේශය රක්ෂිත කලාපයක් ලෙස නම් කිරීමට අදාලව මැදගෙදරගොඩ, ඉඹුල්පේ, එකමුතු ග්‍රාම සංවර්ධන සමිතියේ ගරු ලේකම් සහ ගරු සභාපති විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
වසර කිහිපයකට පෙර ප්‍රාදේශීය සභාව, මැදගෙදරගොඩ ඉඹුල්පේ එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය, ග්‍රීන් ශ්‍රී ලංකා මානුෂීය පදනම, පාසල් දරුවන්, ප්‍රදේශයේ වැඩිහිටි ප්‍රජාවගේ මූලිකත්වයෙන් ඉඹුල්පේ ශාරිපුත්‍ර විද්‍යාලයේ භූමිය තුල රුක්රෝපන වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර, රෝපනය කල එම කුඹුක් වැනි පැළැටි වර්තමානය වනවිට අඩි විස්සකට වඩා උසට වැඩී තිබෙනවා. මැදගෙදරගොඩ ග්‍රාම නිලධාරි වසමේ ගල්පීල්ල ජල පෝෂක කලාපය ආශ්‍රිත වන ලැහැබ වන වගා ක්‍රියාවලියකට හැර, වෙනත් කිසිඳු කටයුත්තක් සඳහා භාවිතා නොකර ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ඉඹුල්පේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යැවීමට කටයුතු කරමු.

මැදගෙදරගොඩ ග්‍රාම නිලධාරි වසමේ ගල්පීල්ල ජල පෝෂක කලාපය ආශ්‍රිත වන ලැහැබ වන වගා ක්‍රියාවලියකට හැර, වෙනත් කිසිඳු කටයුත්තක් සඳහා භාවිතා නොකර ආරක්ෂා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, මැදගෙදරගොඩ ග්‍රාම නිලධාරි වසමේ ගල්පීල්ල ජල පෝෂක කලාපය ආශ්‍රිත වන ලැහැබ වන වගා ක්‍රියාවලියකට හැර, වෙනත් කිසිඳු කටයුත්තක් සඳහා භාවිතා නොකර ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ඉඹුල්පේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට සාකච්ඡා විය.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නැත.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘති මඟින් ජල සම්බන්ධතා ලබා දෙනු ලබන ගිවිසුම් පත්‍රයෙහි හිඟ ජල ගාස්තු අය කරවා ගැනීමට ඇතුළත් කර ඇති කොන්දේසි ප්‍රමාණවත් නොවන බව විගණන විමසුම් මඟින් පෙන්වාදීම හේතුවෙන්,

මාසික බිල්පත ලැබී දින 14 ක් ඇතුළත ගෙවීමට කටයුතු කිරීම, මාස තුනකට වැඩි බිල්පත් සඳහා දැනුම් දීමකින් තොරව අදාල ජල සැපයුම විසන්ධි කිරීමට සභාවට බලය ඇති බව, විසන්ධි කල ජල සැපයුම නැවත ලබා ගැනීමේ දී රු. 3000.00 ක මුදලක් අය කිරීම, විසන්ධි කල ජල සැපයුමත් නැවත ලබා දීම හෝ නොදීම පිළිබඳව අවසන් තීරණය සභාව සතු වීම යන නිර්දේශ ඇතුළත් කර ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව ජල ගිවිසුම් පත්‍රය සංශෝධනය කිරීම සුදුසු බවට ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව ජල ගිවිසුම් පත්‍රය සංශෝධනය කර නව ජල සම්බන්ධතා ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය පාලනය හා ආයතනය සතු වත්කම්, තොග භාරව කටයුතු කරන ලද නිලධාරින්ගෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/99 හා 1999/04/09 දිනැති චක්‍රලේඛය අනුව පනවා ඇති සීමාවන්ට අදාලව සේවක ඇප තැන්පතු මුදලක් පවත්වාගත හැකි බැවින්, සේවක ඇප තැන්පතු මුදල් අයකල යුතු නිලධාරින්ගෙන් සේවක ඇප තැන්පත් ගිණුම් ආරම්භ කර මේ වන විටත් මාසිකව රු. 200.00 බැගින් අය කරන අතර, වර්තමාන වෙළලදපලේ භාණ්ඩවල වටිනාකම අනුව එම මුදල ප්‍රමාණවත් නොවන බැවින්, ඔවුන් එම රාජකාරියේ යෙදෙන තුරු එම මුදල අය කිරීමටත්, එම රාජකාරියෙන් මාරු වූ අවස්ථාවන්වලදී අය කර ගන්නා ලද මුදල ඔවුන් වෙත නිදහස් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ අංක 1/99 හා 1999/04/09 දිනැති චක්‍රෙල්ඛය අනුව පනවා ඇති සීමාවන්ට අදාලව සේවක ඇප තැන්පතු වශයෙන් රාජකාරියේ යෙදෙන තුරු මාසිකව රු. 200.00 ක මුදලක් අය කිරීමටත්, එම රාජකාරියෙන් මාරු වූ අවස්ථාවන්වලදී අය කර ගන්නා ලද මුදල ඔවුන් වෙත නිදහස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ අංක 1/99 හා 1999/04/09 දිනැති චක්‍රෙල්ඛය අනුව පනවා ඇති සීමාවන්ට අදාලව සේවක ඇප තැන්පතු වශයෙන් රාජකාරියේ යෙදෙනතුරු මාසිකව රු. 200.00 ක මුදලක් අය කිරීමටත්, එම රාජකාරියෙන් මාරු වූ අවස්ථාවන්වලදී අය කර ගන්නා ලද මුදල ඔවුන් වෙත නිදහස් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් කැපොක්වත්ත කසල අංගනයේ අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියේ අප ජල ටැංකිය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ රැඳවුම් මුදල නිදහස් කරවා ගැනීමට අදාලව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,

පිළිසරු ව්‍යාපෘතිය යටතේ ලබාදුන් මූල්‍ය ආධාර මත මෙම ව්‍යාපෘතිය සිදු කල අතර, ප්‍රතිපූරණය කිරීමේ පදනම මත සභාව විසින් කොන්ත්‍රාත්කරුවෙකු යොදවා ව්‍යාපෘතිය අවසන් කරන ලදී. ගිවිසුම් ප්‍රකාරව සභා අරමුදලින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් සිදුකර රු.805243.97 ක් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර ඇති නමුත් මෙහි රැඳවුම් මුදල රු. 62131.86 මාස 06 ක් ඉක්මවීමෙන් පසු කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු බැවින් එම ගෙවීම සිදුකර ඇතත්, පිළිසරු ව්‍යාපෘතිය අවසන් කිරීම හේතුවෙන් මුදල් රාජ්‍ය ආදායමට

එකතුකර ඇති බැවින්, රැඳවුම් මුදල සභාවට පිරිනමා නොමැත. මෙමඟින් සභාවට වත්කමක් එකතු වීම, ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වීම නිසා එම රැඳවුම් මුදල සභා අරමුදලින් ගෙවීමටත්, එම රු. 62131.86 ක අත්තිකාරම් මුදල පියවීමත් සුදුසුයි.

එම රැඳවුම් මුදල සහා අරමුදලින් ගෙවීමටත්, එම රු. 62131.86 ක අත්තිකාරම් මුදල පියවීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, එම රැඳවුම් මුදල සහා අරමුදලින් ගෙවීමටත්, එම රු. 62131.86 ක අත්තිකාරම් මුදල ගිණුම් වලට ගැලපීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

(iv). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට 2023 වර්ෂය සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීම සඳහා අනු අංක ps 01 සිට ps 31 දක්වා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය සහා අනුමැතිය ලබා ගැනීමට අදාලව ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

2023 වර්ෂය සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීම සඳහා අනු අංක ps 01 සිට ps 31 දක්වා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය අනුමත කිරීම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂය සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීම සඳහා අනු අංක ps 01 සිට ps 31 දක්වා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.
මෙහි ඇමුණුම 01 පරිදි යා කර ඇත.

(v). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව නමින් පවත්වාගෙන යනු ලබන 2247304 අංක දරණ ජංගම ගිණුමේ පවත්නා ශේෂය 2022 වර්ෂයේ වර්ෂ අවසාන බිල්පත් ගෙවීම් දැරීමට, ආරම්භක වියදම් දැරීමට ප්‍රමාණවත් නොවන බැවින්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව නමින් පවත්වාගෙන යනු ලබන 89558088 අංක දරණ රු. 2,000,000.00 ක් වටිනා ස්ථාවර තැන්පතුව ආපසු ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

වියදම් දැරීම සඳහා සහා අරමුදල් ප්‍රමාණවත් තත්ත්වයක නොමැති බැවින්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව නමින් පවත්වාගෙන ගිය 89558088 අංක දරණ රු. 2,000,000.00 ක් වටිනා ස්ථාවර තැන්පතුව ආපසු ලබා ගැනීම සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, වියදම් දැරීම සඳහා සහා අරමුදල් ප්‍රමාණවත් තත්ත්වයක නොමැති බැවින්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව නමින් පවත්වාගෙන ගිය 89558088 අංක දරණ රු. 2,000,000.00 ක් වටිනා ස්ථාවර තැන්පතුව ආපසු ලබා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(vi). මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළාත් පාලන ආයතන සඳහා සභිකයන් තෝරා පත් කරවා ගැනීම සඳහා මැතිවරණයක් පැවැත්වීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බැවින් 2023 වර්ෂයේ ජනවාරි මස මන්ත්‍රී දීමනාව ගෙවීම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් පවතින බැවින්, දින 10 ක් සඳහා දීමනා ගෙවීම හෝ පළාත් පාලන කොමසාරිස්තුමාගේ වාචික උපදෙස් පරිදි හා මහ සභාවේ එකඟතාවය පරිදි, ජනවාරි මස

මන්ත්‍රී දීමනාව, ඉන්ධන දිමනාව, දුරකතන දිමනාව ගෙවීමටත්, එම දීමනා ගෙවීමෙන් අනතුරුව ලිත් මසකට කලින් සභාව විසුරුවා හැරිය හොත් එම විසුරුවා හරින දිනෙන් පසු කාලය සඳහා වන දිමනා දින 14 ක් ඇතුළත සභාව වෙත ආපසු ගෙවීමේ පොරොන්දුව මත ගෙවීම සඳහා උපදෙස් පතමින් ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

2023 වර්ෂයේ ජනවාරි මාසය සඳහා සම්පූර්ණ මන්ත්‍රී දීමනාව, ඉන්ධන දිමනාව, දුරකතන දිමනාව ගෙවීම සුදුසු බවත්, ගෙවීමෙන් පසු පළාත් පාලන ආයතන විසුරුවා හැරියහොත්, එම විසුරුවා හරින දිනෙන් පසු

කාලය සඳහා ගෙවන ලද දීමනා දින 14 ක් ඇතුළත සභාව වෙත ආපසු ගෙවීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ජී සමන්ත ජයසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂයේ ජනවාරි මාසය සඳහා සම්පූර්ණ මන්ත්‍රී දීමනාව, ඉන්ධන දිමනාව, දුරකතන දිමනාව ගෙවීම සුදුසු බවත්, ගෙවීමෙන් පසු පළාත් පාලන ආයතන විසුරුවා හැරියහොත්, එම විසුරුවා හරින දිනෙන් පසු කාලය සඳහා ගෙවන ලද දීමනා දින 14 ක් ඇතුළත සභාව වෙත ආපසු ගෙවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් ගලගම සංචාරක ගිමන්හල සේවා සැපයීමකින් තොරව වසා දමා ඇති බැවින්, කඩිනමින් එම සේවා කටයුතු ආරම්භ කිරිම සඳහා සුදුසු බඳුකරුවෙකු තොරා ගැනීම, අවම බඳු මුදල තිරණය කරවා ගැනීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි ප්‍රාදේශීය මට්ටමින් සීමිත මිළ ගණන් ඔස්සේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීම, මේ සඳහා වන දැන්වීම් බල ප්‍රදේශය තුල පිහිටි ප්‍රධාන රාජ්‍ය ආයතන තුල ප්‍රදර්ශනය කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි ප්‍රාදේශීය මට්ටමින් සීමිත මිළ ගණන් ඔස්සේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින්, බල ප්‍රදේශයේ පදිංචි ඉල්ලුම්කරුවන්ගෙන් තරඟකාරී ලංසු කැඳවා එහි වැඩිම ලංසුවට ලබා දීම, රු. 10000/- ක අවම මුදලක් තීරණය කිරීම, ඒ සඳහා බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන අතර දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ජී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි ප්‍රාදේශීය මට්ටමින් සීමිත මිළ ගණන් ඔස්සේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින්, බල ප්‍රදේශයේ පදිංචි ඉල්ලුම්කරුවන්ගෙන් තරඟකාරී ලංසු කැඳවා එහි වැඩිම ලංසුවට ලබා දීම, රු. 10000/- ක අවම මුදලක් තීරණය කිරීම, ඒ සඳහා බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන අතර දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(viii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් රත්මලවින්න හියුම් බට අංගනයේ නිෂ්පාදනය කරනු ලබන හියුම් බට හා ඉන්ටර්ලොග් ගල්වල නිෂ්පාදන පිරිවැය ඉහළයාම හේතුවෙන් එම මිළ සංශෝධනය කලයුතු බවට කාර්මික නිලධාරි මහතා නිර්දේශ ඉදිරිපත් කර ඇති බැවින්, එම නිර්දේශ අනුව එම නිෂ්පාදනයන්හි මිළ සංශෝධනය කිරීමට අදාලව යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතුවෙන් එම නිෂ්පාදන අලෙවි කිරීමේ මිළ ගණන් පහත පරිදි සංශෝධනය විය යුතු බවට කාර්මික නිලධාරි මහතා විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

| අනු අංකය | වර්ගය | ප්‍රමාණය | පැවැති මිළ | යෝජිත මිළ |
|---|---|---|---|---|
| 01 | හියුම්බට | විශ්කම්භය අඩි 1(300mm) දිග අඩි 4 (1200mm) | රු. 4200.00 | රු.8000.00 |
| 02 | හියුම්බට | විශ්කම්භය අඩි 1 ½ (450mm) අඩි 4 (1200mm) | රු.5200.00 | රු.9100.00 |
| 03 | හියුම්බට | විශ්කම්භය අඩි 2 (600mm) දිග අඩි 4 1200mm | රු.5700.00 | රු. 10300.00 |
| 04 | ඉන්ටර්ලොග් ගල් | | රු 35.00 | රු. 45.00 |

කාර්මික නිලධාරි මහතා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව හියුම්බට හා ඉන්ටර්ලොග් ගල් කැට අලෙවි කිරීමේ මිළ ගණන් සංශෝධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ජී. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ජී සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ඉහත යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව කාර්මික නිලධාරි මහතා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව හියුම්බට හා ඉන්ටර්ලොග් ගල් කැට අලෙවි කිරීමේ මිළ සංශෝධනය කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ix). ඉඹුල්පේ ර/ ශාරිපුත්‍ර විද්‍යාලයේ හිස් භූමියක් තුල රුක්රෝපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා රු. 30500.00 ක් වටිනා වියදම් ඇස්තමේන්තුව සහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
ඉඹුල්පේ ර/ ශාරිපුත්‍ර විද්‍යාලයේ හිස් භූමියක් තුල රුක්රෝපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමත්, ඒ සඳහා ඉදිරිපත් කරන ලද රු. 30500.00 ක් වටිනා වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ජී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ඉඹුල්පේ ශාරිපුත්‍ර විද්‍යාලයේ හිස් භූමියක් තුල රුක්රෝපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමත්, ඒ සඳහා ඉදිරිපත් කරන ලද රු. 30500.00 ක් වටිනා වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(x). ඉඹුල්පේ යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනය විසින් ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ප්‍රධානතම රාජ්‍ය ආයතනයන්ගේ මූලිකත්වයෙන් පැවැත්වීමට නියමිත සුහද ක්‍රිකට් තරගාවලියේ සංග්‍රහ කටයුතු සඳහා වියදම් දැරීම සඳහා යම් මුදලක් ලබා දෙන ලෙසට ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, සහකාර තරුණ සේවා නිලධාරි, ජී.එච්. රුවන් අනුර කුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් ඒ සඳහා රු. 40,000.00 ක වටිනාකමකින් යුතු අත්තිකාරම් මුදලක් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ලබා දීමට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස තීරණය කරන ලද බව ප්‍රකාශ කරමින් එම යෝජනාව සභා සම්මත කරන ලෙසට ප්‍රකාශ කරන ලදී.

ඉඹුල්පේ යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනය විසින් පැවැත්වීමට නියමිත සුහද ක්‍රිකට් තරඟාවලිය සඳහා සංග්‍රහ කටයුතු සඳහා වියදම් දැරීමට සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ලබා දීමට තීරණය කරන ලද රු. 40,000.00 ක අත්තිකාරම් මුදල ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ජී. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ඉඹුල්පේ යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනය විසින් පැවැත්වීමට නියමිත සුහද ක්‍රිකට් තරඟාවලිය සඳහා සංග්‍රහ කටයුතු සඳහා වියදම් දැරීමට රු. 40,000.00 ක අත්තිකාරම් මුදලක් ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

### (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද දෙසැම්බර් මස 01 වන දින සිට දෙසැම්බර් මස 30 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 102 සහ වවුචර් අංක 1033 -1152 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන, මුදල් කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අනු අංක 01 – 17 දක්වාත්, දෙසැම්බර් මස ගෙවීමට අදාල ගෙවීම් වවුචර් අනු අංක 01 – 05 දක්වාත්,අනු අංක 01 – 19 දක්වාත් වවුචර් උපලේඛන 2022.12.30. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත්

එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවේ අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2022 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

(i). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
ප්‍රදේශයේ වැදගත් කම නිසාත්, ලැබෙන ලිපි විධිමත් පරිදි ලබා ගැනීම සඳහාත් පින්නවල බලංගොඩ මාර්ගයේ වැගපිටිය වැවපාරට හැරෙන මංසන්ධියේ සිට ඇල්ලේඅරාව දෙසට මීටර් 20 ක් දුරින් වම් පැත්තට දිවෙන මාර්ගය සෙත්සිරි මාවත ලෙස නම් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ඩී.එම්.ටී. දිසානායක මහතා විසින් තමන් වෙත ඉල්ලීම් කල බව සඳහන් කරමින්, මෙම මාර්ගය සමහි මාවත ලෙස නම් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
මෙම මාර්ගය සෙත්සිරි මාවත ලෙස නම් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ අනෙකුත් ආයතන වෙත දන්වා යැවීමට කටයුතු කරමු.

ඒ අනුව පින්නවල බලංගොඩ මාර්ගයේ වැගපිටිය වැවපාරට හැරෙන මංසන්ධියේ සිට ඇල්ලේඅරාව දෙසට මීටර් 20 ක් දුරින් වම් පැත්තට දිවෙන මාර්ගය සෙත්සිරි මාවත ලෙස නම් කිරීමත්, ඒ බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ අනෙකුත් ආයතන වෙත දන්වා යැවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ඕලුගංතොට ගල්අරාව මාර්ගය ආසන්නයේ නිවාස 15 ක පමණ පදිංචිකරුවන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි කරුවන් වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සීමා නිර්ණය කිරීමේ කටයුතු සිදු කිරිමත් සමඟ, එම නිවාස බලංගොඩ නගර සභා බල ප්‍රදේශයට අයත් විමත් සමඟ බලංගොඩ නගර සභාව විසින් එම පදිංචිකරුවන්ට වරිපනම් ගාස්තු ගෙවන ලෙසට දැනුම් දී තිබෙනවා.

වැගපිටිය කොට්ඨාසයේ ඇල්ලේඅරාව මැලිබන් ඇඟලුම් කම්හල ඉදිරිපිට තරුණ සේවා සභාව විසින් පවත්වාගෙන ගිය ඉඩමත්, ගොඩනැගිල්ලත් ප්‍රාදේශීය සභාවට අයත් වූවකි. වර්තමානයේ දී එම ආයතනය නොපැවැත්වෙන අතර, එම ගොඩනැගිල්ල අවභාවිතා වෙමින්, පරිහානියට ලක්වෙමින් පවතින නිසා, ප්‍රාදේශීය සභා භූමියේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින්, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව හෝ සුදුසු වෙනත් අංශයක් එම ස්ථානයේ ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සලසමු.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
හත්වන සභාවාරයේ පවත්වනු ලබන අවසන් මාසික මහ සභා රැස්වීම මෙය විය හැකි බැවින් මෙතෙක් පවත්වන ලද මාසික මහ සභාවාරයන් පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කරන්න මා කැමතියි. සභා බල ප්‍රදේශයේ පුරවැසියෙක් ලෙස ප්‍රාදේශීය සභාව නියෝජනය කර ප්‍රදේශවාසීන්ට සාධාරණයක් ඉටු කිරීමට මා බලාපොරොත්තු වූ අතර ඒ සඳහා මා විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළත්, එක් යෝජනාවක් හෝ ක්‍රියාත්මක කරවා ගැනීමට නොහැකි විය. එම යෝජනා සඳහා මහ සභාවේ අනුග්‍රහය ලබා නොදීම හා අවලාද

නැගීම, තේරුමක් නැති කතන්දර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මා කණගාටුව පල කරමි. වරක් මාසික මහ සභා රැස්වීම් වාරයකදී මාගේ හිදිසි අවශ්‍යතාවයක් සඳහා සභා ගර්භයෙන් නික්ම යාමට සිදු විය. එම අවස්ථාවේදී එක් මන්ත්‍රීවරයෙක් විසින් මාගේ පක්ෂ නායක අනුරකුමාර මැතිතුමා දේපල අයිතිකර ගැනීම සඳහා පුංචි අම්මා විවාහකරත් බවට නින්දිත ප්‍රහාරයක් එල්ල කර තිබුණි. බරපතල චෝදනාවක් බැවින් මා එම අවස්ථාවේ සිටියානම් ඒ පිළිබඳව පැහැදිලි කරන්න තිබුණා. එතුමා කුඩා කාමරයක කුඩා කාමරයක රැඳී සිටින්නේ ඉඩකඩම් නොමැති බැවිනි. මා නියෝජනය කරනු ලබන පක්ෂ දේශපාලන ක්‍රියාවලියට අනුව, පක්ෂ සාමාජිකයන් විසින් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිට මිය ගිය රණවිරුවන්ගේ භාර්යාවන් විවාහ කර ගැනීමේ යෝජනාවකට අනුව එතුමා විසින් වැන්දඹු කාන්තාව විවාහ කරගන්නා ලදී. පසුගිය ආණ්ඩු කාලයේ මෙරට විශාල අපරාධ ප්‍රමාණයක් සිදුවුණ බව ප්‍රකාශ කිරීමේ දී ඒ සෑම අවස්ථාවකදීම 1988, 1989 යන වර්ෂවල භීෂණ කාල පිළිබඳව පතරංග ජාතකය මෙන් එහි විකෘතිය විග්‍රහ කළා. සැබෑ තත්ත්වය ප්‍රකාශ කලේ නැහැ. සභා රැස්වීමක දී මීට වඩා ශිෂ්ඨ සම්පන්න ආකාරයකට කතා කල යුතුයි. දේශපාලන ක්‍රියාවලිය තුල අවලාද නැගීම සුභාවාදී පැත්තක් නොවන අතර රටේ ජනතාවට අවබෝධයෙන් යුතුව නිවැරදි දේ දැන ගැනීමට ඉඩ සැලසිය යුතුයි.

මෙම අවස්ථාවේ දී, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා නැගී සිටිමින් අදහස් දක්වමින්,
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කතාවට බධා කිරීම ගැන මා සමාව ඉල්ලා සිටිනවා. එහෙත් අනුර කුමාර දිසානායක මැතිතුමා යනු දේශපාලන පුද්ගලයෙක් පමණි. මගේ දේශපාලන ක්‍රියාවලිය තුල මටත් පක්ෂ නායකයෙක් සිටිනවා. එතුමා ගැනත් කතා කළොත් සභාවේ කටයුතු පවත්වාගෙන යන්න අවස්ථාවක් නොමැති බවත්, සභා රැස්වීම් කටයුතු වලට අමතරව අපට වෙනත් රාජකාරී කටයතු පවතින බවත්, එම නිසා සභා බල ප්‍රදේශයට අයත් දේ පමණක් කතා කරන ලෙසත්, ඔබතුමා සමඟ පෞද්ගලික තරහක් නොපවතින බැවින්,සභාව ආරම්භයේ සිට මේ දක්වා ඉතාමත් සුහදව මෙතුමා සමඟ කටයුතු කළා. මෙතුමාගේ පෞද්ගලික ප්‍රශ්න සභාවට අදාල නොවන නිසා අහන් ඉන්න අවස්ථාවක් ද නොමැත. එම නිසා සභා බල ප්‍රදේශයට අදාල කරුණු සම්බන්ධයෙන් ගරු සභාපතිතුමනි ඔබතුමා සභාව මෙහෙයවන ලෙසට ප්‍රකාශ කරන ලදී.

ඉන් අනතුරුව, නැවතත් ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මහජන නියෝජිතවරුන් පත් කර ඇත්තේ සභා බල ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සේවා සැපයීමට අදහස් ප්‍රකාශ කිරීම සඳහායි. බල ප්‍රදේශය තුල ජීවත්වන ජනතාවට අදාල නොවන අදහස් සභාවට ඉදිරිපත් කිරීමට ඉඩ නොදීම නිසා අවලාද නගනවා කියා ප්‍රකාශ කරනවා. ඒ සියල්ල ඉවසා, සභා රීති නොසලකා අද දින ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා. ඔබතුමාගේ කතාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා බාධා කලේ අදාල නොවන කතාවක් බැවිනි. ඒ පිළිබඳව එතුමාට ස්තුතිය ප්‍රකාශ කරනවා. අවලාද නගන බවටත්, කතා කරන්න අවස්ථාව ලබා නොදෙන බවටත්, චෝදනා කරන නිසා කතාවට විරෝධය නොදක්වා අවස්ථාව ලබා දුන්නත් ඒ දේශපාලන නායකයන් ගැන අදහස් දක්වන්න නොවෙයි. මෙය අවසාන සභාව වන්නත් නොවන්නත් පුළුවන්.

එම ප්‍රකාශයත් සමඟ නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
ඔබතුමා අද මෙලෙස මාගේ කතාවට විරෝධය ප්‍රකාශ කරනවා මෙන්, එදා සභා බල ප්‍රදේශයට අදාල නොවන ලෙස අදහස් ඉදිරිපත් කල එම මන්ත්‍රීතුමාගේ කතාවට විරෝධය ප්‍රකාශ කරන්න තිබුණා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
එක් සභා වාරයකදී ඔබතුමා විසින් ප්‍රකාශ කල අදහසකට අනුව, මා අදහස් ඉදිරිපත් කරන ලද අවස්ථාවකදී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ලෙස අදහස් ප්‍රකාශ කරන බව සඳහන් කල බැවින්, ඒ අනුව පාර්ලිමේන්තුවේ 225 න් එක් අයෙක් ලෙසට මා ගැන ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් සතුටට පත් වන අතර ඔබතුමාට ස්තුතිය පල කරනවා. ගරු සභාපතිතුමනි එතුමා පැවසූ කතාව එදින ඉදිරිපත් කලේ මම තමයි. මම
කණගාටුවෙනවා නාමයෝජනා භාර දීමට මා තීරණය නොකිරීම පිළිබඳව ඊට හේතුව එහි වාසිය වෙනත් පක්ෂයක් විසින් ලබාගැනීමට හැකියි. මීන් ඉදිරියේ දී දේශපාලන කටයුතු කරනවා ප්‍රසිද්ධියේ ශ්‍රී ලං.පො.පෙ.ප. වෙනුවෙන්. ඔබතුමාගේ පක්ෂ සංවිධායක දොස්තර මහතෙක් සමහර පක්ෂ සාමාජිකයන් මඟින් බූරු ගස්සනවා. ගල් ටික හොරෙන් අද්දවනවා. ඔවුන්ගේ නම් ඉදිරිපත් කල හැකියි. විවේචනය කරලා

ෆේස්බුක් එකට ඉදිරිපත් කිරීමට හැකි බව ප්‍රකාශ කිරීමත් සමඟ, ඔබතුමාට ඒ පිළිබඳව පොලීසියට දැනුම් දෙන්න තිබුණු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සහා බල ප්‍රදේශයේ ජනතාවට අදාල ප්‍රශ්න තිබේනම්, ඒවා කතා කිරිම සඳහා නැවත වාරයක් අවස්ථාව ලබා දෙන බවත්, එවැනි අවස්ථාවලදී සභාපතිවරයා ලෙස මම හෝ මන්ත්‍රීවරුන් ඔබගේ කතාවට විරුද්ධ නොවනු ඇති බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. එම අවස්ථාවේ දී, වැගපිටිය ප්‍රදේශය සඳහා වීජී පහනක් සවි කිරීමේ යෝජනාව හා මම ඉදිරිපත් කල අනෙකුත් යෝජනා ක්‍රියාත්මක නොකල බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් ප්‍රකාශ කරන ලදී.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීලෝගම ග්‍රාමසේවා වසමේ, බඳුලු පාරේ, පැපොල්වත්ත හරහා හෙවනමුල්ලේ සිට ඌරු බොක්ක ගම්මානයෙන් බිම්තැනිගොල්ල දක්වා කිලෝමීටර් එකක් දුරට දිවෙන මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ර/ ශාරිපුත්‍ර විද්‍යාලය තුල සහා අරමුදලින් රුක්රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට අදාලව යෝජනාවක් සභාවට ඉදිරිපත් කළා. මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සූදානමින් පවතින අවස්ථාවකදී, සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් සභා අරමුදලින් මෙවැනි කටයුතු සිදු කරන්නේනම් ඒ පිළිබඳව දැනුම් දිය යුත්තේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියටද? එසේ නැත්නම් මැතිවරණ කොමිසමටද? නීතිමය තත්ත්වය නොදන්නා නිසා විමසූ බවත් ඒ පිළිබඳව දැනගන්න කැමති බවත් ප්‍රකාශ කරන ලදී. මෙහි නීතිමය තත්ත්වය කුමක්ද? දේශපාලනය කිරිම ගැන ගැටළුවක් නොවෙයි එහෙත් මේ සම්බන්ධයෙන් නිවැරදි වැටහීමක් නොමැති බැවින් සත්‍ය වටහා ගැනීමට මා කැමතියි. මැතිවරණය ප්‍රකාශයට පත් කර ඇතත් ඡන්දය පවත්වන්නේ කෙදිනකදැයි නොදනිමි.

(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමාගේ අදහස් දක්වමින්,
ගුරුබැවිල වසමේ පින්නකන්ද සමනල පෙර පාසල ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසලක් වන අතර අධික සුළං තත්ත්වය නිසා මෙම පෙර පාසලට දැඩි ලෙස අලාභහානි සිදුවුණා. ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමණාකරණය ඒකකය වෙත දැනුම් දීමත් සමඟ සෙවිලි ෂීට් 02 ක් ලැබුණත්, එය ප්‍රමාණවත් නොවන බැවින් වහලයට තාවකාලිකව ඉටිරෙද්දක් සෙවිලි කර පෙර පාසල පවත්වාගෙන ගියත් එලෙස පවත්වාගෙන යා නොහැකි බැවින් ඒ සඳහා සභාවේ දායකත්වය ලබා දෙමු.
බලංගොඩ මධ්‍ය මහා විදුහලේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන පල්ලේවෙල ප්‍රදේශයේ දරුවෙක් දරුණු පිළිකා රෝගයකින් පෙළෙන අතර එම දරුවා සුවකරවා ගැනීම සඳහා ලක්ෂ තිස්පහක පමණ මුදලක් අවශ්‍ය වන අතර ඒ සඳහා ලක්ෂ දාහතක් පමණ රැස්කරගෙන තිබෙන බව දැන්ගන්නට ලැබුණු අතර ඒ සඳහා සභා සහයෝගය ලබා දීමට කටයුතු කරමු.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
බලංගොඩ මධ්‍ය මහා විදුහලේ ඉගෙනුම ලබන දරුවෙක් දරුණු පිළිකා රෝගයකින් පෙළෙන අතර එම රෝගය සුව කරවා ගැනීම සඳහා ශල්‍ය කර්මයක් සිදු කිරීම සඳහා ලක්ෂ තිස්පහක් පමණ අවශ්‍ය වන බවත්, ඒ සඳහා දැනට ලක්ෂ දා හතක් පමණ එකතු කරගෙන තිබෙන බවත් දැනගන්නට ලැබුණා. ප්‍රදේශයේ මහජන නියෝජිතවරුන් ලෙස ඒ සඳහා ආධාරයක් ලබා දීමට කටයුතු කරමු.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා අදහස් දක්වමින්,
පසුගිය මාසික මහ සභා වාරයේ දී බල ප්‍රදේශයේ ආර්ථික අපහසුතාවයන් සහිත පවුල්වල දැරුවන් සඳහා ප්‍රාදේශීය සභාව විසින් පාසල් පොත් සහ ඉගෙනුම් ද්‍රව්‍ය ලබා දිමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කළා. මේ වන විට එහි වර්තමානය තතත්ත්වය කෙසේද?

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා අදහස් දක්වමින්,

2018 වර්ෂයේදී පළාත් පාලන මහජන නියෝජිතයන් තෝරා ගැනීම සඳහා මැතිවරණයට ඉදිරිපත් ව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ලෙස තේරී පත් ව, මංගල සභාව පැවැත්වූ දින සිට අද දින සභා වාරය දක්වා මා නියෝජනය කරන ලද කොට්ඨාසය සම්බන්ධ යෝජනා ඉදිරිපත් කල අවස්ථාවල්වලදී ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය උපරිම සහයෝගය සහ දායකත්වය ලබා දීමට කටයුතු කළා. එම නිසා ඉදිරියේ දී පැවැත්වෙන ඕනෑම මැතිවරණයකට නිර්භයව මුහුණ දිය හැකි බව සතුටින් දන්වා සිටිනවා. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ලද මන්ත්‍රීවරයෙක් ලෙස හත්වන සභාවාරයේ අවසන් රැස්වීම මෙය විය හැකි බැවින් මා වෙත සහයෝගය ලබාදුන් සැමටම ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දුරකතනය මඟින් දැනුම් දුන්නා. එබැවින් එතුමන්ලාගේ නිවාඩු අනුමත කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
එතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(x). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
අඩු ආදායම්ලාභී ජනතාවට රජය විසින් ලබාදෙනු ලබන සහනාධාර මුදල් ලබා ගැනීම සඳහා වසම් දොළහක පමණ පිරිසක් සමෘද්ධි කාර්යාලය අසල රැඳී සිටිනවා. මේ නිසා වසම් මට්ටමින් සහනාධාර දීමනාව ලබා දීම සඳහා එක් දිනයක් නම් කරන ලෙස එම ආයතන දැනුවත් කරමු.

ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සහ අදහස් සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා පිළිතුරු සහ විසඳුම් ලබා දීමට අදහස් දක්වමින්,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
පින්නවල බලංගොඩ මාර්ගයේ වැගපිටිය වැවපාරට හැරෙන මංසන්ධියේ සිට ඇල්ලේඅරාව දෙසට මීටර් විස්සක් දුරින් වම් පැත්තට දිවෙන මාර්ගය සෙත්සිරි මාවත ලෙස නම් කිරීමට අවශ්‍ය පියවර ගන්නා අතර ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා අදාල ආයතන වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචිකරුවන් බවත්, නගර සභාවෙන් වරිපනම් ගෙවන ලෙසට දන්වා එවා ඇති බවත්, එක් එක් ඉල්ලුම්කරුවන් වෙන් වෙන්ව ඒ පිළිබඳව ලිඛිතව සභාව වෙත දැනුවත් කිරිමට පියවර ගන්නා ලෙසට එම ගම්වාසීන්ට දැනුම් දෙන්න. මෙම යෝජනාවට අදාල ලිපියේ පිටපත් ලේකම් වෙත භාර දෙන්න. එම දැනුම්දීම අනුව නගර සභාව දැනුවත් කිරිමට අවශ්‍ය පියවර ගන්නවා.

වැගපිටිය කොට්ඨාසයේ ඇල්ලේඅරාව මැලිබන් ඇඟලුම් කම්හල ඉදිරිපිට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටා ඇති භූමිය සහිත ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාවට අයත් වුවත්, ප්‍රාදේශීය සභාව සමඟ විධිමත් හා නිත්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව පවත්වාගෙනයාම නිසා, නැවත සභාවට පවරා ගැනීමේ නිසි ක්‍රමවේද විමසා බලා ක්‍රියා කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
සීලෝගම ග්‍රාමසේවා වසමේ, බදුලු පාරේ, පැපොල්වත්ත හරහා හෙවනමුල්ලේ සිට ඌරු බොක්ක ගම්මානයෙන් බිම්තැනිගොල්ල දක්වා කිලෝමීටරයක් දුරට දිවෙන මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව හිටපු සභාපතිවරයෙක් වන වි.බ.මු. වීරසේකර බණ්ඩාර මැතිතුමා ගේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා සභාවට ඉදිරිපත් කළා. මෙහි නීතිමය ගැටළුවක් පවතින

බව ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් දැනගැනීමට ලැබුණා. පෞද්ගලික ඉඩම් සඳහා ද මාර්ග ලබා දිය යුතු බැවින් නිත්‍යානුකූලභාවය විමසා බලා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
සභා අරමුදලින් රුක්රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, ඒ පිළිබඳව යම් ගැටළුකාරී අවස්ථාවක් උද්ගත වුණොත්, එම වැඩසටහන සඳහා දරන ලද පිරිවැය මාගේ පෞද්ගලික මුදලින් ගෙවීමට මා සූදනමින් සිටිනවා. එහෙත් මැතිවරණය ප්‍රකාශයට පත් කරන ලද ක්‍රියාවලියේ දී නාම යෝජනා භාරගැනීමේ කටයුතු පමණක් සිදු වේ. මැතිවරණ ප්‍රවර්ධන කටයුතු සිදු නොකල යුතු වුවත්, පාසලක රුක්රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මැතිවරණ ප්‍රවර්ධන කටයුත්තක් නොවේ. එමෙන්ම මෙම යෝජනාව ඉදිරිපත් කරන ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා නැවත මැතිවරණයට ඉදිරිපත් වන්නේ නැහැ. සභාපතිවරයා ලෙස අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැත. එයට හේතුව සභාපතිවරයාගේ භූමිකාවේ පමණක් යෙදී සිටින අතර දේශපාලන කටයුතු සඳහා නැවත ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන්නේ නැත. පළාත් පාලන ආයතන විසුරුවා හරිනතුරු ධූරයේ වැඩකටයුතුවල නියැලිය යුතුයි. මුළු සභාවටම බලපෑ හැකි බැවිනුත්, මැතිවරණ ප්‍රවර්ධන කටයුතු ලෙස ප්‍රකාශ කල හැකි බැවිනුත්, සංවර්ධන යෝජනා ඉදිරිපත් නොකරන ලෙසත් මැතිවරණ ප්‍රවර්ධන කටයුතු ක්‍රියාත්මක නොකර සිටිමු යනුවෙන් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
වෛද්‍ය සහතික ඇතුළු මෙවැනි ලිඛිත ඉල්ලීම් සඳහා නිත්‍යානුකූලභාවය හා විධිමත් ආකාරය තහවුරු කර සභා අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව රු. 5000/- ක් වැනි මුදලක් ලබාදිය හැකියි. එලෙස යම් සහනයක් ලබා දිය හැකි වුවත්, එම ක්‍රියාවලිය සඳහා ලිපි ලේඛන සකස් කිරීම, අනුමැතිය ලබා ගැනීම සඳහා විශාල කාලයක් ගතවිය හැකි බැවින්, සභා අරමුදලින් සහයෝගය ලබා දීම පිළිබඳව නොසලකා හැර, මහජන නියෝජිතවරුන්ගේ දීමනාවෙන් පෞද්ගලිකව දායකත්වය ලබා දීමට කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
අඩු ආදායම්ලාභී දරුවන් සඳහා පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබා දීමට අදාල ඉල්ලීම් සභාව වෙත ලැබී නොමැති අතර එම ඉල්ලීම් විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, එම ඉල්ලීම් අප වෙත ලබා දිය යුතුය. මෙම වැඩසටහන දේශපාලන මැදිහත්වීමෙන් තොරව පවත්වාගෙන යාමට කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
සභාව විසින් ලබා දුන් සහයෝගයට ස්තූතිය පුද කර, වරදක් සිදුවුණානම් ඒ සඳහා සමාව ඉල්ලමින් නිහතමානී ගුණය විදහා පෑවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
අඩු ආදායම්ලාබීන් සඳහා රජය විසින් සහනාධාර මුදල් ගිණුමට බැර වී ඇත්නම් පෝලිම් වල රැඳී නොසිට තමන් කැමැති අවස්ථාවක දී ලබා ගැනීමට හැකියාව තිබේ.

(09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.
2023 වර්ෂයේ පෙබරවාරි මස 14 වෙනි අඟහරුවාදා දින ඊළඟ සභා වාරය පැවැත්වීමට කටයුතු කරනවා.

(10). ස්තූති කතාව හා අවසානය.
හත්වන සභාවේ පනස් නමවන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.
ඉන් අනතුරුව, පෙ.ව. 11.35 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.